සැ. යු. -(i) 2018.10.19 දින පළ වූ අංක 2,094 දරන ගැසට් පත්‍රයේ I : III සහ IV(අ) කොටස් පළ නොවිය.
(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2018 වර්ෂය සඳහා මාතලේ දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,095 - 2018 ඔක්තෝබර් මස 26 වැනි සිකුරාදා - 2018.10.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු | 1712 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය | — |
| බඩුබාහිරාදිය විකිණීම් | — |
| පළාත් පාලන නිවේදන | 1716 |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන | — |
| අයවැය ලේඛන | — |
| දේපළ විකිණීම් | — |
| විවිධ දැන්වීම් | 1719 |

සැ. යු. - විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත 2018 ඔක්තෝබර් මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 නොවැම්බර් මස 16 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 නොවැම්බර් මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

### තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුර | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | පුස්තකාල සහායක III වන ශ්‍රේණිය | 01 | PL1-2016<br>24250-10×250-10×270-10×300-12×330-36410 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබිය යුතුය. |

02. බඳවා ගැනීමේ කොන්දේසි :

1. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
2. අයදුම්කරුවන් මනා මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
3. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක් බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කරුවකු විය යුතුය.
4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් දකුණු පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ)
5. බඳවා ගැනීමේ පටිපාටිය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට යොමු කරන අතර, එහිදී ලබා ගන්නා ඉහලම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගැනේ.
6. දැනටමත් බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ එම තනතුරුවල අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ දෛනික පදනම යටතේ සේවයේ නියුක්ත වූවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලබන අතර, ඔවුන් ආයතන ප්‍රධානියා මගින් තම අයදුම් පත ඉදිරිපත් කල යුතුය.
7. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිවලට ද, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසි වලටද, බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව පනවනු ලැබ ඇති හා වරින් වර පනවනු ලබන නීතිරීතිවලටද යටත් විය යුතුය.
8. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතුය.

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

I. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.
II. වැන්දඹු/ පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.
III. බඳවා ගනු ලබන අය වසර 03 ක පරිවාස කාලයකට යටත්ය. එම කාලය තුළදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කරනු ලැබේ.
IV. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුව අවශ්‍ය භාෂා ප්‍රවීනතාව ලබා ගත යුතුය.
V. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

04. තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්:

| | | | |
|---|---|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | උපරිම ලකුණු ප්‍රමාණය | = | 30 |
| අමතර සුදුසුකම් | උපරිම ලකුණු ප්‍රමාණය | = | 10 |
| පළපුරුද්ද | උපරිම ලකුණු ප්‍රමාණය | = | 10 |
| සභා බල ප්‍රදේශයේ පදිංචිය (වසරකට ලකුණු 5 බැගින්) | උපරිම ලකුණු ප්‍රමාණය | = | 45 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුශලතාවය | උපරිම ලකුණු ප්‍රමාණය | = | 05 |
| | එකතුව | | 100 |

(තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය 50%)

05. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කළ යුතුය ෑ
උප්පැන්න සහතිකය;
ජාතික හැඳුනුම්පත;
අධ්‍යාපන සහතික, ඉහලම අධ්‍යාපන සුදුසුකම් දැක්වෙන සහතික;
තම පදිංචිය සහතික කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම සේවා සහතිකය;
මෑතකදී ලබා ගන්නා ලද චරිත සහතික දෙකක්;
සේවා පළපුරුද්ද පිළිබඳ සහතික;
වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික;
(මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්පත් පමණක් පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.)

06. අයදුම්පත් ඉදිරිපත් කරන ආකාරය ෑ

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කරන ලද අයදුම්පත් 2018.11.12 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "සභාපති - බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව - බෙලිඅත්ත" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේ දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලතල බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය.

සිරිල් මුණසිංහ,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2018 ක් වූ ඔක්තෝබර් මස 12 වැනි දින,
බෙලිඅත්ත,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

.................................................................. තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම් පත්‍රය.

01. මුලකුරු සමඟ නම :...............................................
02. මුලකුරුවලින් හැඳින්වෙන නම :...............................................
03. ස්ථිර ලිපිනය :...............................................
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :...............................................
05. ජාතික හැඳුනුම්පත් අංකය :...............................................

06. උපන් දිනය : වර්ෂය:............... මාසය :............... දිනය:..................
07. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු:............... මාස :............... දින :..................
08. විවාහක/ අවිවාහක බව :..............................................
09. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? යන වග :..............................................
10. ඔබ සාපරාධී වරදක් සම්බන්ධව උසාවියකින් වරදකරුවකු කර තිබේ ද?:.............................................. :
11. අධ්‍යාපන සුදුසුකම්

| අ.පො.ස (සා/පෙ.) | අ.පො.ස. (උ/පෙ.) |
|---|---|
| ............................................... | ............................................... |
| ............................................... | ............................................... |
| ............................................... | ............................................... |
| ............................................... | ............................................... |
| ............................................... | |
| ............................................... | |
| ............................................... | |
| ............................................... | |

12. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :..............................................
:
13. ඔබ දැනට බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ හෝ දකුණු පළාත් රාජ්‍ය සේවයේ නියුතු නම්:

1. දැනට දරන තනතුර:..............................................
2. එම තනතුරට පත්වූ දිනය:..............................................
3. එම පත්වීමේ ස්වභාවය :..............................................
(ස්ථිර/ ආදේශක/ අනියම්/ කොන්ත්‍රාත්/ දෛනික පදනම ද යන වග)

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බව ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද දනිමි.

දිනය :........................ ...............................................;
අයදුම්කරුගේ අත්සන

*ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ආයතනයේ ............................................... ලෙස සේවය කරනු ලබන ........................................................................මයා/මිය/මෙය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු කාර්යාලයීය ලිපි ලේඛන අනුව නිවැරදි වේ. මෙම තනතුරට තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක. අයදුම් පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

ආයතන ප්‍රධානියාගේ අත්සන :........................;
නම :........................
තනතුර :........................ :

දිනය :........................

10 - 1509

## ගලේවෙල ප්‍රාදේශීය සභාව

2017.09.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2038 දරන ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ පළකරන ලද 09-429 දැන්වීමට වැඩිමනත් වශයෙන් පළ කරනු ලබන ගලේවෙල ප්‍රාදේශීය සභාවේ කාර්යාල කාර්ය සහායක තනතුර සඳහා බඳවා ගැනීමේ අධ්‍යාපනික සුදුසුකම් හා වෙනත් සුදුසුකම් සඳහා වූ සංශෝධිත ගැසට් නිවේදනයයි.

එම ගැසට් පත්‍රයේ පළ කරන ලද බඳවා ගැනීමේ අධ්‍යාපනික සුදුසුකම් පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුර* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | කාර්යාල කාර්ය සහායක | 01 | PL1-2016 A<br>රු. 24,250-10×250-10×270-10×300-12×330- රු. 36,410 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම, මින් විෂයයන් 05ක් එක්වරකදී සමත්ව තිබිය යුතුය. |

*ඉල්ලුම් කළ යුතු ආකාරය* :

2017.09.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2038 දරන ගැසට් පත්‍රයේ IV(ආ) දරන ගැසට් පත්‍රයේ සඳහන් ආදර්ශ ආකෘතිය ප්‍රකාරව අයදුම්පත 2018 නොවැම්බර් 07 දිනට හෝ ඊට පෙර "සභාපති, ප්‍රාදේශීය සභාව, ගලේවෙල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතු අතර, අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතික වල අනු පිටපත් අමුණා එවිය යුතුය.

01. උප්පැන්න සහතිකය
02. අධ්‍යාපන සහතික
03. හැඳුනුම්පතේ පිටපතක්
04. මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක් (ඉන් එක් චරිත සහතිකයක් ග්‍රාම නිලධාරි සහතිකය විය යුතුය.)
05. දැනට මෙම ආයතනයේ සේවයේ නියුක්ත වන්නේ නම් සේවා සහතික

201709.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,038 දරන ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ පළ කරන ලද දැන්වීමට අනුව මේ වන විටත් යොමු කරන ලද අයදුම්පත්‍ර ද තවදුරටත් වලංගු වේ.

ඇම්. පී. ආර්. ජයතිලක,
සභාපති,
ගලේවෙල ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 22 වැනි දින,
ගලේවෙල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

10-1520

# පළාත් පාලන නිවේදන

## මාතර මහා නගර සභාව

2019 අයවැය ලේඛනය

2019 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද ආදායම් හා වියදම් ඇතුළත් කෙටුම්පත් අයවැය ලේඛණය මාතර මහා නගර සභා කාර්යාලයේ දී මහජනතාවගේ පරීක්ෂාව සඳහා 2018.10.26 දින සිට දින හතක (07) කාලයක් විවෘතව තබන බව මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 2012 (ආ) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ජී. රංජිත් යසරත්න,<br>
නගරාධිපති,<br>
මාතර මහා නගර සභාව.

2018 ඔක්තෝබර් මස 26 වැනි දින,<br>
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

10-1240

---

## කොළොන්නාව නගර සභාව

2019 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

255 අධිකාරය වන 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 160 (I) වන වගන්තියෙන් කොළොන්නාව නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කොළොන්නාව නගර සභාවේ 2018 වර්ෂයේ අගෝස්තු මස 29 වැනි දින පවත්වන ලද බදු කමිටුවේ හා 2018 වර්ෂයේ සැප්තැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී 2019 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම සඳහා පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

සභාපති,<br>
කොළොන්නාව නගර සභාව.

2018 සැප්තැම්බර් මස 17 වැනි දින,<br>
කොළොන්නාව නගර සභාවේ දී ය.

### යෝජනාව

255 අධිකාරය වන 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 160(I) වන උපවගන්තිය යටතේ කොළොන්නාව නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බල ප්‍රදේශය තුළ පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2019 වර්ෂය සඳහා වූ තක්සේරුව සත්‍යෝක්ෂණය වර්ෂය සඳහා සම්මත කළ යුතු බවටත් එකී තක්සේරුව මත 255 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ 160 (I) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සහා බල ප්‍රදේශය තුළ පිහිටි සියලුම ව්‍යාපාරික හා වානිජමය ස්ථානවල දැනට තක්සේරු කර ඇති වාර්ෂික වටිනාකමින් 20%ක ප්‍රතිශතයක් හා අනෙකුත් සියළුම ඉඩම්, තනාගෙන යනු ලබන ගොඩනැගිලි හා නිවාසවලට වාර්ෂික වටිනාකමින් 8%ක ප්‍රතිශතයක් ද වරිපනම් බදු ලෙස පනවා අය කිරීමටත්,

තව ද, 2019 වර්ෂයේ පළමුවැනි, දෙවැනි, තෙවැනි සහ සිව්වැනි කාර්තුවල වරිපනම් බදු පිළිවෙලින් මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි හෝ ඊට පෙර අදළ වන පරිදි ගෙවා අවසන් කළ යුතු බවත්, එසේ නොගෙවනු ලබන වරිපනම් බදු වෙනුවෙන් දේපළ ස්වභාවය අනුව පිළිවෙලින් ව්‍යාපාරික හා වානිජමය ස්ථානවලට 20% (විස්සක) හා ගෘහස්ථ සඳහා 15% (පහළොවක) අධි ගාස්තුවක් අය කිරීමටත්,

තව ද, 2019 ජනවාරි මස 31 වැනි දින හෝ ඊට පෙර මුළු වර්ෂයටම වරිපනම් ගෙවනු ලැබුවහොත් එසේ වර්ෂයට ගෙවීමට ඇති මුදලින් 10% (දහයක) වට්ටමක් ද, එය කාර්තු වශයෙන් කාර්තුවේ පළමු මස තුළ ගෙවනු ලැබුවහොත් කාර්තුවට ගෙවීමට ඇති සම්පූර්ණ මුදලින් 5% (පහක) වට්ටමක් ද ලබා දීමටත් යෝජනා කරමි.

සභාපති,<br>
කොළොන්නාව නගර සභාව.

2018 අගෝස්තු මස 07 වැනි දින,<br>
කොළොන්නාව නගර සභාවේ දී ය.

10-1272

## අක්මීමන ප්‍රාදේශීය සභාව

### අතුරු ව්‍යවස්ථා වැලඳ ගැනීම

අක්මීමන ප්‍රාදේශීය සභාවේ 2018.07.10 දින පැවති මාසික මහ සභා රැස්වීමේ යෝජනා අංක 6.1 යටතේ පහත යෝජනාව සම්මත වූ බවට මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

සභාපති,
අක්මීමන ප්‍රාදේශීය සභාව.

2018 අගෝස්තු මස 07 වැනි දින,
අක්මීමන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

1982 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධි විධාන) පනත හා 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබ 2013 මැයි මස 17 සිකුරාදා දින අංක 1811 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පල කරන ලද්ද වූ දකුණු පළාත් සභාව විසින් අනුමත කරන ලද 2014.08.29 වැනි දින අංක 1878 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරන ලද්ද වූ අතුරු ව්‍යවස්ථා අතුරින් පහත උපලේඛනයේ දක්වන්නා වූ අතුරු ව්‍යවස්ථාවන් අක්මීමන ප්‍රාදේශීය සභාව පිළිගෙන වැලඳ ගැනීමට සුදුසු බවටත්, එකී අතුරු ව්‍යවස්ථා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් මහජනතාව වෙත නීත්‍යානුකූල ලෙස ප්‍රසිද්ධ කරන දින සිට අක්මීමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මා විසින් යෝජනා කරන්නීය.

### උපලේඛනය

| | | |
|---|---|---|
| I කොටස | - | සියලු සම්මත අතුරු ව්‍යවස්ථා වලට අදාළ අර්ථ නිරූපිත පිළිබඳ අතුරු ව්‍යවස්ථා |
| II කොටස | - | සියලු සම්මත අතුරු ව්‍යවස්ථා වලටම අදාළ පොදු විධිවිධාන අතුරු ව්‍යවස්ථාව |
| III කොටස | - | කිසියම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන හෝ නියමයන් උල්ලංඝණය කිරීම සම්බන්ධ දඬුවම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| IX කොටස | - | කිරි පට්ටි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| X කොටස | - | පිහිණුම් තටාක පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| XVI කොටස | - | කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| XVII කොටස | - | අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| XIX කොටස | - | පදික මාරු ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| XX කොටස | - | ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා කිරීම, අධීක්ෂණයට හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| XXII කොටස | - | මාර්ගවලට අලාභහානි සහ මාර්ගවල ගමනාගමනයට බාධා කිරීම වැලැක්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| XXIII කොටස | - | ආදාහනාගාර විධිමත් කිරීම පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |
| XXVI කොටස | - | ප්‍රජා ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |

10 -1245

**මහනුවර මහා නගර සභාව**

2019 වර්ෂය සඳහා අයවැය ලේඛනය

මහා නගර සභා ආඥාපනතේ 212(ආ) වගන්තිය ප්‍රකාරව 2019 මුදල් වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය 2018 නොවැම්බර් මස 01 වැනි දින සිට දින හතක (07) කාලයක් මහජනයාට පරීක්ෂා කර බැලීම සඳහා පහත සඳහන් ස්ථාන වල තබා ඇති බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

(1) මහ නගර සභා ගරු මන්ත්‍රීවරුන්ගේ නිල කාමරය - මහා නගර සභාව මහනුවර

(2) නාගරික කොමසාරිස් කාර්යාලය - මහා නගර සභාව, මහනුවර

(3) නාගරික ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලය - මහා නගර සභාව, මහනුවර

(4) ඩී. එස්. සේනානායක අනුස්මරණ මහජන පුස්තකාලය, මහනුවර

කේසර ඩී. සේනානායක.
නගරාධිපති,
මහනුවර මහා නගර සභාව.

2018 සැප්තැම්බර් මස 21 වැනි දින,
මහනුවර මහා නගර සභා කාර්යාලයේ දී ය.

10-1234

---

**ගාල්ල මහා නගර සභාව**

2019 වසර අයවැය ලේඛනය

2019 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද ආදායම් හා වියදම් ඇතුලත් කෙටුම්පත් අයවැය ලේඛනය 2018.10.30 වැනි දින සිට දින 07ක කාලයක් ගාල්ල මහා නගර සභා කාර්යාලයේ දී මහජනතාවගේ පරීක්ෂාව සඳහා විවෘතව තබන බව මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 212 'ආ' වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රියන්ත ජී. සහබන්දු,
නගරාධිපති,

2018 ඔක්තෝබර් මස 10 වැනි දින,
ගාල්ල මහා නගර සභා කාර්යාලයේ දී ය.

10-1472

---

**කඩුවෙල මහා නගර සභාව**

2019 වර්ෂයේ වැඩසටහන් අයවැය ලේඛනය

කඩුවෙල මහා නගර සභාවේ 2019 වර්ෂය සඳහා වූ වැඩසටහන් අයවැය උපලේඛනය 2018 ඔක්තෝබර් 25 වැනි දින සිට 2018 නොවැම්බර් මස 01 වැනි දින තෙක් (රජයේ නිවාඩු දින හා ඉරිදා දින හැර) කාර්යාල වේලාව තුළ කඩුවෙල මහා නගර සභාවේ ප්‍රධාන කාර්යාලයේ දී මහජනතාවගේ පරීක්ෂාව පිණිස තබා ඇති බව 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 212 (ආ) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරමි.

ජී. බුද්ධික තුෂාර ජයවිලාල්,
නගරාධිපති,
කඩුවෙල මහා නගර සභාව.

2018 ඔක්තෝබර් මස 04 වැනි දින,
කඩුවෙල මහා නගර සභා කාර්යාලය,
කඩුවෙල.

10-1335

**හෝමාගම ප්‍රාදේශීය සභාව**

විනෝද බදු පැනවීම

267 වන විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තිය ප්‍රකාර හෝමාගම ප්‍රාදේශීය සභා පරිපාලන බල සීමාව තුළ විනෝද බදු ආඥාපනත යටතට ගැනිය හැකි මුදල් අයකරනු ලබන සංදර්ශනයක් වන විට විනෝද බදු අය කිරීම සඳහා 2018.07.18 වැනි දින අංක 5:01:8 දරන සභා යෝජනාව සභා සම්මත වූ බවත් එම යෝජනාව 1989 අංක 12 දරන පළාත් සභා ආනුශංගික විධිවිධාන පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු විනෝද බදු ආඥාපනතේ 2වන වන්තියේ 3 වන උපවගන්තිය යටතේ බස්නාහිර පළාතේ පලාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා දී එම අනුමැතිය සඳහන් නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කල දින සිට බලාත්මක වන්නේ ය.

**යෝජනාව**

267 වන අධිකාරය වූ විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තිය ප්‍රකාරව හෝමාගම ප්‍රාදේශීය සභා පරිපාලන සීමාව තුළ විනෝද බදු ආඥාපනත යටතේ ගැනිය හැකි මුදල් අය කරනු ලබන සංදර්ශනයක් වන විටකදී එසේ සංදර්ශනය සඳහා ඇතුල්වීමෙන් අය කරනු ලබන මුදලින් 15% ක ප්‍රතිශතයක් යටතේ වූ විනෝද බද්දක් මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා පනවා අය කළ යුතු බවත් එසේ වුවද එම සංදර්ශනය චිත්‍රපට සංදර්ශනයක් වන අවස්ථාවකදී 10% ක ප්‍රතිශතයක විනෝද බද්දක් අය කළ යුතු බවත් යෝජනා කරමි.

සභාපති,
ප්‍රාදේශීය සභාව,
හෝමාගම

10-1233

---

# විවිධ දැන්වීම්

**බලංගොඩ නගර සභාව**

2019 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

බලංගොඩ නගර සභාව විසින් 2018 වර්ෂයේ සැප්තැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 04:02:11 යටතේ ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරය හෙවත් 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 160 වන වගන්තිය ප්‍රකාරව පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

තවද, ඉහත කී ආඥාපනතේ 166 වන වගන්තිය යටතේ බලංගොඩ නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බලංගොඩ නගර සභා සීමාව ඇතුළත පිහිටියා වූ නිවාසවල ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2012 වර්ෂයේ දී සිදු කරන ලද තක්සේරුව/ සත්‍යෝක්ෂණය 2019 වර්ෂය සඳහා පාදකකර ගැනීමටත් එකී තක්සේරුව මත ඉහත කී නගර සභා ආඥාපනතේ 160 වන වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල යටතේ බලංගොඩ නගර සභා බල ප්‍රදේශයේ ඇතුළත පිහිටියා වූ කිසියම් දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා නියමකර ඇති වාර්ෂික වටිනාකමින්,

(අ) නේවාසික ස්ථාන සඳහා සියයට හතර (4%) ක වාර්ෂික වරිපනම් බද්දක් ද,
(ආ) වෙළඳ හෝ වානිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන දේපළයන් මත සියයට පහ (5%) ක වරිපනම් බද්දක් ද, නියම විය යුතු බවටත්

තවද, 2019 වර්ෂයේ පහත උපලේඛනයෙහ් සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඊට ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද නගර සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස සමස්ත වාර්ෂික වරිපනම් බද්ද 2019 වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහය (10%)ක වට්ටමක්ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල නගර සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් කාර්තුවකට අදාළ මුදලින් සියයට පහ (5%)ක වට්ටමක්ද නගර සභාව විසින් ලබා දිය යුතු බවටත් නියම කර නිවේදනය කරමි.

චමික ජයමිණි විමලසේන,
සභාපති.
බලංගොඩ නගර සභාව.

2018 ඔක්තෝබර් මස 04 වැනි දින,
බලංගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

*ඉහත කී උපලේඛනය*

| *කාර්තුව* | *ගෙවිය යුතු දිනය* | *5%ක වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
|---|---|---|
| 2019 වර්ෂයේ පළමුවන කාර්තුව | 2019.03.31 | 2019.01.31 |
| 2019 වර්ෂයේ දෙවන කාර්තුව | 2019.06.30 | 2019.04.30 |
| 2019 වර්ෂයේ තුන්වන කාර්තුව | 2019.09.30 | 2019.07.31 |
| 2019 වර්ෂයේ හතරවන කාර්තුව | 2019.12.31 | 2019.10.31 |

10 - 1238/1

## බලංගොඩ නගර සභාව

### 2019 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

බලංගොඩ නගර සභාව විසින් 2018 වර්ෂයේ සැප්තැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 04:02:11 යටතේ පහත දක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මානත බද්ද, එම වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

චමික ජයමිණි විමලසේන,
සභාපති.
බලංගොඩ නගර සභාව.

2018 ඔක්තෝබර් මස 04 වැනි දින,
බලංගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 165 අ වගන්තියෙන් නගර සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර බලංගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුලත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ I වැනි තීරුවේ ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2019 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බවට වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

| *අනු. අංකය* | *1 වන තීරුව කර්මාන්තයේ ස්වභාවය* | *11 වන තීරුව පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
|---|---|---|---|---|
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. | කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | ස්වර්ණාභරණ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | මැටි භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | දුරකථන/ඡායාපිටපත් යන්ත්‍ර අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | මැණික් කැපීම හා ඔප දැමීම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | මිනී පෙට්ටි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | වඩු කර්මාන්තශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | තේ කර්මාන්තශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | ගමන් මළු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | පාවහන් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ගීත/වීඩියෝ පටිගත කිරීම හෝ තැටිගත කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | පින්තූර රාමු කිරීමේ වැඩපල | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | 1 වන තීරුව කර්මාන්තයේ ස්වභාවය | 11 වන තීරුව පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක | රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක | රු. 1,500 ඉක්මවන අවස්ථාවක |
|---|---|---|---|---|
| | | රු. ශත | රු. ශත | රු. ශත |
| 13. | වාහන බ්‍රේක් ලයිනර් /ක්ලච් ප්ලේට් නිපදවීමේ වැඩපල | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | ඇඟලුම් කර්මාන්තශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | පොහොර නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | සිසිල්බීම නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | යෝගට් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | රසකැවිලි නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | ගම් වර්ග නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | විෂබීජ නාශක ද්‍රව්‍ය නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | ඉටිපන්දම් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | හඳුන්කූරු නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | බිම ඔපදමන පොලිෂ් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | කොහු නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | කොසු/ඉදල් පිරිසිදු කිරීමේ උපකරණ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | වේවැල් භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | දුම්කොළ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | ඩිජිටල් ප්‍රින්ටින් | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | ඡායා පිටපත් ගැනීමේ ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | ඇඳුම් මැසීමේ ස්ථාන (ටේලර් ෂොප්) | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | ජංගම දුරකථන අලුත්වැඩියා කිරීමේ ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | ඉලෙක්ට්‍රොනික් උපකරණ අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | නගර සහ උද්‍යාන අලංකරන සැළසුම් සකස් කරනු ලබන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

10-1238/2

---

## බලංගොඩ නගර සභාව

### 2019 වර්ෂය සඳහා ව්‍යාපාරික බද්ද පැනවීම

බලංගොඩ නගර සභාව විසින් 2018 වර්ෂයේ සැප්තැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 04:02:11 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද, එම වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

චමික ජයමිණි විමලසේන,
සභාපති.
බලංගොඩ නගර සභාව.

2018 ඔක්තෝබර් මස 04 වැනි දින,
බලංගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරය හෙවත් 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 165 ආ වගන්තියෙන් නගර සභා වලට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී ආඥාපනතේ 165 අ වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් බලංගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී කරගෙන යනු ලබන තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකිරීමටත්. බද්දට යටත් සෑම තැනැත්තෙකුම එකී ව්‍යාපාර බද්ද 2019 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර බලංගොඩ නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බවට වැඩි දුරටත් නිවේදනය කරමි.

**උපලේඛනය**

| *I වන තීරුව* | *II වන තීරුව*<br>*ගෙවිය යුතු බද්ද*<br>*රු. ශත* |
|---|---|
| රුපියල් 6,000 0 නොඉක්මවන අවස්ථාවක | - - |
| රුපියල් 6,000 0 ඉක්මවන එහෙත් රුපියල් 12,000 නොඉක්මවන අවස්ථාවක | 90 0 |
| රුපියල් 12,000 0 ඉක්මවන එහෙත් රුපියල් 18,750 0 නොඉක්මවන අවස්ථාවක | 180 0 |
| රුපියල් 18,750 0 ඉක්මවන එහෙත් රුපියල් 75,000 0 නොඉක්මවන අවස්ථාවක | 360 0 |
| රුපියල් 75,000 0 ඉක්මවන එහෙත් රුපියල් 1,50,000 නොඉක්මවන අවස්ථාවක | 1,200 0 |
| රුපියල් 1,50,000 ඉක්මවන අවස්ථාවක | 3,000 0 |

**දෙවන කොටස**

ව්‍යාපාරික බද්දට යටත් වන විෂයයන් :

01. අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්
02. ආයුර්වේද බෙහෙත් අලෙවිය
03 ඇස් කණ්නාඩි අලෙවි කිරීම
04. ඉංග්‍රීසි බෙහෙත් අලෙවිය (ෆාමසි)
05. ඉන්ධන පිරවුම්හල
06. උකස්බඩු ගන්නා ස්ථාන
07 උත්සව භාණ්ඩ කුලී පදනම මත සැපයීම
08. උත්සව ශාලාවක් පවත්වාගෙන යාම
09. කුළු බඩු එකතු කිරීම හා අලෙවිය
10. කෘෂි උපකරණ අලෙවිය
11. කොමිස් නියෝජිතවරුන්/වෙන්දේසිකරුවන්
12. ඛණිජ තෙල් හා ලිහිසුම් තෙල් අලෙවිය
13. ගෘහ නිර්මාණ සැළසුම් සකසන ස්ථානයක් පවත්වාගෙන යාම
14. ගෘහ භාණ්ඩ අලෙවිය
15. ගෘහ සේවක සේවිකාවන් සැපයීම
16. ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය
17. ග්‍රොසරියක් පවත්වාගෙන යාම
18. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
19. ටයර්/ටියුබ් අලෙවිය
20. තරාදි අලෙවිය
21. තේ පිටි සකස් කිරීම හා අලෙවිය
22. තොග වෙළෙඳාම
23. දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම
24. දැව/ලී අලෙවිය
25. දුම් පරීක්ෂණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම

26. දුරකථන අලෙවිය
27 දුරකථන සේවා (කොමිනිකේෂන්)
28. දේශීය වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම /ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම
29. නිමි ඇඳුම් අලෙවිය
30. නොතාරිස්/නීතිඥ කාර්යාලයක් පවත්වාගෙන යාම
31. අබලි ද්‍රව්‍ය එකතු කිරීම හා අළෙවිය
32. පරිගණක අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
33. පරිගණක/පරිගණක උපාංග අලෙවිය
34. පාවහන් අලෙවිය
35. පුද්ගලික නියෝජිත තැපැල් කාර්යාල
36. පූජා භාණ්ඩ අලෙවිය
37. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
38. ප්ලාස්ටික් භාණ්ඩ අලෙවිය
39. බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම (මෙඩිකල් සෙන්ටර්ස්)
40. රටබීම අලෙවිය
41. මල් සහ පැළ වර්ග අලෙවිය
42. මැටි භාණ්ඩ අලෙවිය
43. මිශ්‍ර වෙළෙඳාම
44. මූල්‍ය ආයතන
45. මෝටර් වාහන අමතර කොටස් අලෙවිය
46. මෝටර් සයිකල් අලෙවිය
47. යන්ත්‍රසූත්‍ර කුලී පදනම මත සැපයීම
48. රක්ෂණ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
49. රථ වාහන අලෙවිය
50. රථ වාහන කුලී පදනම මත යෙදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
51. රන් භාණ්ඩ ස්වර්ණාභරණ අලෙවිය
52. රා තැබෑරුමක් පවත්වාගෙන යාම
53. රියදුරු පුහුණු පාසලක් පවත්වාගෙන යාම
54. රෙදිපිළි වෙළෙඳාම
55. රේස් ඔට්ටුපලක් පවත්වාගෙන යාම
56. ලිපිද්‍රව්‍ය පාසැල් උපකරණ අලෙවිය
57. ලේ/මුත්‍ර පරීක්ෂාව/ රසායනාගාර සේවාවන් පවත්වාගෙන යාම
58. ලොතරැයි අලෙවිය
59. විදුලි උපකරණ අලෙවිය
60. විසිතුරු භාණ්ඩ අලෙවිය (ලවර්ස්)
61. වීඩියෝ පටි/තැටි කුලියට දීම හා අළෙවිය
62. ව්‍යායාම උපකරණ අලෙවිය
63. ශබ්ද විකාශන යන්ත්‍ර කුලී පදනම මත සැපයීම
64. ශරීර සුවතා මධ්‍යස්ථාන
65. සාත්තු සේවා කටයුතු
66. සිමෙන්ති ගල්/කොන්ක්‍රීට් නිෂ්පාදන අලෙවිය
67. සිල්ලර වෙළෙඳාම

10-1238/3

---

## බලංගොඩ නගර සභාව

### 2019 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

බලංගොඩ නගර සභාව විසින් 2018 වර්ෂයේ සැප්තැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 04:02:11 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද බලපත්‍ර ගාස්තු, එම වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

චමික ජයමිණි විමලසේන,
සභාපති.
බලංගොඩ නගර සභාව.

2018 ඔක්තෝබර් මස 04 වැනි දින,
බලංගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

1939 අංක 61 දරන නගර සභා ආඥාපනත හෙවත් ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරයේ 162 වන වගන්තිය ප්‍රකාරව හා වැළඳගත් සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා බලංගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2019 වර්ෂයට නියම විය යුතු බවට ද එකී බලපත්‍ර ගාස්තුව 2019 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක විය යුතු බවට ද,

තව ද එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පලක් වන විටකදී ඊට අදළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2018 වර්ෂයේ ලැබීම්වලින් 1% (සියයට එක) ක් බලපත්‍ර ගාස්තු ලෙස 2019 වර්ෂය සඳහා නියමවිය යුතු බවටත් එම නියමයට 2019 ජනවාරි මස 01 වැනි දින ක්‍රියාත්මක විය යුතු බවටත් මම තීරණය කරමි.

**ඉහත කී උපලේඛනය**

| *I වන තීරුව* | | *II වන තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *කර්මාන්තයේ ස්වභාවය* | *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. | නවාතැන්පලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | ලැගුම්හලක් (රෙස්ටුරන්ට්) පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | භෝජනාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | හෝටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | තේ, කෝපි/සිසිල්බීම අලෙවිහලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | කරණවැමි මැදිරියක් (බාබර් සාප්පු) පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | ගෝ ඝාතකාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | මස්/මාළු/බිත්තර අලෙවිහලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | පපඩම් ඇසුරුම් කිරීම හා අළෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | බිම්මල් ඇසුරුම් කිරීම හා අළෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | යෝගට් ඇසුරුම් කිරීම හා අළෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | රසකැවිලි ඇසුරුම් කිරීම හා අළෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | සත්ත්ව ගොවිපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | සත්ත්ව ආහාර ඇසුරුම් කිරීම හා අළෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | වඩුමඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | සුරතල් සතුන් අලෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | I වැනි තීරුව කර්මාන්තයේ ස්වභාවය | II වැනි තීරුව පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත |
|---|---|---|---|---|
| 21. | ගරාජයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | මෝටර් රථ/ත්‍රී රෝද රථ/යතුරු පැදි සේවා කිරීම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | මනාලියන් හැඩ ගැන්වීමේ ස්ථාන රූපලාවන්‍යාගාර | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | පාපැදි අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | කිරි පට්ටි/කිරි විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | මිනී එම්බාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | දියලුණු පැකට් කර අළෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | ස්ප්‍රේ පේන්ට් වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | යාන්ත්‍රික බලය පාවිච්චි නොකර රන්/රිදී ආලේප කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | පුපුරන ද්‍රව්‍ය,රසායන ද්‍රව්‍ය, ගිනි කෙළි භාණ්ඩ අළෙවිය | 500 0 | 750 0 | 1000 0 |
| 31. | බැටරි පිරවීම/ බැටරි අළෙවිය හෝ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | අවමංගල්‍ය සේවා පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | හිස් ගෝනි/පොහොර උර ගබඩා කිරීම/අළෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | දැව ඉරුම් පට්ටල | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | පොල්තෙල් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | සිමෙන්ති විකිණීම හා ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | සිමෙන්ති ගඩොල් /කොන්ක්‍රීට් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | වේවැල් බඩු සෑදීම හෝ ගබඩාකර තැබීම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | ඇසිඩ් ගැලුම් 05ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | පොලිතීන්, සෙලියුලොයිඩ් හෝ පර්පෙක්ස් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | ටයර්, ටියුබ් වෝල්කනයිස් කිරීමේ වැඩපල | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | ලියවන පට්ටල පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | තීන්ත හෝ වාර්නිෂ් හොණ්ඩර 05 වඩා ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | පාවිච්චි කරන ලද ටයර් හෝ ටියුබ් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | අලුත් ටයර් හෝ ටියුබ් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | ගෘහ භාණ්ඩ/දැව භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | කොහු/පුළුන්/රබර් මෙට්ට හෝ කොට්ට ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | කඩදාසි කිලෝ 250ට වඩා ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | අයිස්ක්‍රීම් ඇසුරුම් කිරීම හා අළෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | දුම්කොළ පැකට් කර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | කෘෂි රසායන පොහොර ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | ආහාර ද්‍රව්‍ය තොග වශයෙන් අළෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |

## බලංගොඩ නගර සභාව

### 2019 වර්ෂය සඳහා සුනඛ ගාස්තු පැනවීම

බලංගොඩ නගර සභාව විසින් 2018 වර්ෂයේ සැප්තැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 04:02:11 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත *හෙවත්* ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 477 අධිකාරයේ 4 වැනි වගන්තිය අනුව බලංගොඩ නගර සභා සීමාව ඇතුළත ඇති කරනු ලබන සෑම බල්ලෙක් හා බැල්ලියක් වෙනුවෙන් 2019 වර්ෂයේ දී මෙම සභාවට ගෙවිය යුතු වාර්ෂික සුනඛ බද්ද රුපියල් එකසිය පනහ (150) විය යුතු බවට පනවා එම පැනවීම 2019 වර්ෂයේ ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවට වැඩි දුරටත් නිවේදනය කරමි.

චමික ජයමිණි විමලසේන,
සභාපති.
බලංගොඩ නගර සභාව.

2018 ඔක්තෝබර් මස 04 වැනි දින,
බලංගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

10 - 1238/5

---

## බලංගොඩ නගර සභාව

### 2019 වර්ෂය සඳහා කසළ ගාස්තු පැනවීම

බලංගොඩ නගර සභාව විසින් 2018 වර්ෂයේ සැප්තැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 04:02:11 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරය වූ නගර සභා ආඥාපනතේ 170(අ) 1, 2 වගන්ති හා එහි 157(9)(ආ) ප්‍රකාරව 1952 අංක 06 දරන පළාත් පාලන මණ්ඩල ආදර්ශ උපනීති 1956 ජුනි 08 දින *ගැසට්* අංක 10939 අනුව බලංගොඩ නගර සභාව විසින් *ගැසට්* අංක 11429 හා 1958 ජුනි 18 දින සම්මත කර ගැනීමෙන් පසු එකී පනතේ XXI කාණ්ඩයේ කැලි කසල ඉවත් කිරීම පිළිබඳ උපනීති (4) වගන්තිය අනුව කසල ගාස්තු අයකළ යුතු ආයතන හා ගාස්තුව පහත පරිදි වන බව නිවේදනය කරමි.

චමික ජයමිණි විමලසේන,
සභාපති.
බලංගොඩ නගර සභාව.

2018 ඔක්තෝබර් මස 04 වැනි දින,
බලංගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

| *ස්වභාවය* | *වාර්ෂික ගාස්තු* | *කාර්තුවකට අය කළ යුතු මුදල* |
|---|---|---|
| | *රු. ශත* | *රු. ශත* |
| නවාතැන්පල | 4,080 0 | 1,020 0 |
| හෝටල් | 4,080 0 | 1,020 0 |
| බේකරි | 4,800 0 | 1,200 0 |
| රෙදි කඩ | 4,800 0 | 1,200 0 |
| බත් කඩ, කෝපි කඩ, ආපන ශාලා, තේ කඩ | 2.400 0 | 600 0 |
| භෝජනාගාර | 4,080 0 | 1,020 0 |
| සුපිරි වෙළඳසැල් | 9,600 0 | 2.400 0 |
| සිල්ලර කඩ | 1,800 0 | 450 0 |
| තේ කඩ | 2,400 0 | 600 0 |

| *ස්වභාවය* | *වාර්ෂික ගාස්තු* | *කාර්තුවකට අය කළ යුතු මුදල* |
|---|---|---|
| | *රු. ශත* | *රු. ශත* |
| සැලුන්, රූපලාවන්‍යාගාර | 1,200 0 | 300 0 |
| වී මෝල් | 3,600 0 | 900 0 |
| පුද්ගලික පන්ති | 3,000 0 | 750 0 |
| තොග වෙළඳසැල් | 6,000 0 | 1,500 0 |
| හාඩ්වෙයාර් | 1,800 0 | 450 0 |
| සුරාසැල් | 4,800 0 | 1,020 0 |

10 - 1238/6

---

## බලංගොඩ නගර සභාව

### 2019 වර්ෂය සඳහා ගෝඝාතක ආඥපනත ප්‍රකාරව කොටු ගාස්තු පැනවීම

බලංගොඩ නගර සභාව විසින් 2018 වර්ෂයේ සැප්තැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 04:02:11 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරය හෙවත් 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 162(1) වන වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව 1894 අංක 09 දරන ගෝ ඝාතක ආඥාපනතේ 09 වන වගන්තිය ප්‍රකාරවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍ර* අංක 10436 හා 1952.08.22 *ගැසට්* නිවේදනයේ අංක 10 අනුව මෙහි පහත උපලේඛනයේ සඳහන් පරිදි කොටු ගාස්තු නියම කර 2019 වර්ෂයේ ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවට නිවේදනය කරමි.

චමික ජයමිණි විමලසේන,
සභාපති.
බලංගොඩ නගර සභාව.

2018 ඔක්තෝබර් මස 04 වැනි දින,
බලංගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

.

**උපලේඛනය**

| | |
|---|---|
| ගවයෙක් ඝාතනය කිරීමේ කොටු ගාස්තුව | රු. 200 0 |
| එළුවෙක් ඝාතනය කිරීමේ කොටු ගාස්තුව | රු. 100 0 |
| තාවකාලික ගෝ ඝාතක බලපත්‍ර ගාස්තුව | රු. 500 0 |
| වාර්ෂික ගෝ ඝාතක බලපත්‍ර ගාස්තුව | රු. 3,000 0 |

10-1238/7

---

## බලංගොඩ නගර සභාව

### 2019 වර්ෂය සඳහා බලංගොඩ නගර සභාවෙන් සපයනු ලබන සේවාවන් සඳහා ගාස්තු පැනවීම

බලංගොඩ නගර සභාව විසින් 2018 වර්ෂයේ සැප්තැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 04:02:11 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරය හෙවත් 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතින් පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ගාස්තු 2019 වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක විය යුතු බවට නිවේදනය කරමි.

චමික ජයමිණි විමලසේන,
සභාපති.
බලංගොඩ නගර සභාව.

2018 ඔක්තෝබර් මස 04 වැනි දින,
බලංගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

## උපලේඛනය

| අනු. අංකය | සේවාව | කාරණය | 2019 වර්ෂයට ගාස්තුව රු. |
|---|---|---|---|
| 01. | ජල සහතිකයක් ලබාගැනීම | • අයදුම්පත්‍ර ගාස්තුව<br>• සහතික ගාස්තුව | 100 0<br>200 0 |
| 02. | විදුලි සහතිකයක් ලබා ගැනීම | • අයදුම්පත්‍ර ගාස්තුව<br>• සහතික ගාස්තුව | 100 0<br>200 0 |
| 03. | වීථි රේඛා සහතිකයක් ලබා ගැනීම | • අයදුම්පත්‍ර ගාස්තුව<br>• සහතික ගාස්තුව | 100 0<br>750 0 |
| 04. | ජල බවුසරය කුලියට සැපයීම | • පානීය ජල බවුසරයක්<br>• පානීය නොවන ජල බවුසරයක්<br>• ස්ථානයේ නතරකර තැබීම දිනකට | 3,000 0<br>2,750 0<br>2,000 0 |
| 05. | ක්‍රීඩා පිටිය කුලියට දීම | • ක්‍රීඩා පිටිය පමණක් දිනකට<br>• ප්‍රේක්ෂකාගාරය සමග දිනකට<br>• ක්‍රීඩා පිටිය ලබා දීම එක් රාත්‍රියක් සඳහා | 2,500 0<br>4,000 0<br>25,000 0 |
| 06. | ජේ. සී. බී. යන්ත්‍රය කුලියට දීම | එක පැයක් සඳහා | 2,250 0 |
| 07. | ගල්රෝල කුලියට දීම | එක පැයක් සඳහා | 2,660 0 |
| 08. | මෝටර් ග්‍රේඩරය කුලියට දීම | එක පැයක් සඳහා | 4,800 0 |
| 09. | පස් සම්පීඩන යන්ත්‍රය | එක පැයක් සඳහා | 3,200 0 |
| 10. | කොඩි කණු කුලියට ලබාදීම | එක කණුවක් එක දිනකට | 50 0 |
| 11. | ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීම | අයදුම්පත්‍ර ගාස්තුව | 200 0 |
| 12. | බිම්කට්ටි සැළසුම් අනුමත කිරීම | අයදුම්පත්‍ර ගාස්තුව | 100 0 |
| 13. | ගලි සේවාව සැපයීම | • නගර සීමාවේ නිවාස/ආගමික ස්ථාන/පුණ්‍ය ස්ථාන/පාසල් සඳහා/රජයේ ස්ථාන<br>• නගර සීමාවේ ව්‍යාපාරික ස්ථාන සඳහා<br>• නගර සීමාවෙන් පිටත නගර සීමාවේ නිවාස/ආගමික ස්ථාන/පුණ්‍ය ස්ථාන/පාසල් සඳහා<br>• නගර සීමාවෙන් පිටත ව්‍යාපාරික/රජයේ ස්ථාන සඳහා<br>• නගර සීමාවෙන් පිටත අවම ප්‍රවාහන ගාස්තුව<br>• නගර සීමාවෙන් පිටතට කි. මී. 25ට වඩා යාමේදී කිලෝ මීටර් 01ක් සඳහා | 4,500 0<br>5,500 0<br>5,750 0<br>6,250 0<br>2,500 0<br>100 0 |
| 14. | සුසාන භූමි ගාස්තු | • මිනියක් මිහිදන් කිරීම<br>• සහා සේවකයින් 02ක් සැපයීමේ ගාස්තුව<br>• ස්මාරක ඉදිකිරීමේ ගාස්තුව<br>• අළු තැන්පත් කිරීම වර්ග අඩි 01ක කුටිය | 1,300 0<br>3,000 0<br>අවසර නැත<br>15,000 0 |

| අනු. අංකය | සේවාව | කාරණය | 2019 වර්ෂයට ගාස්තුව රු. |
|---|---|---|---|
| 15. | නොපවරා ගැනීමේ සහතිකයක් ලබා ගැනීම | • අයදුම්පත්‍ර ගාස්තුව<br>• සහතික ගාස්තුව | 100 0<br>750 0 |
| 16. | ගස් පරීක්ෂා කිරීම | • කොස්, ගැහැණු තල්, කැලෑ දෙල් ගස් සඳහා<br>• අනෙකුත් ගස් සඳහා | 1,000.00<br>500.00 |
| 17. | ඔප්පු ලුහුඬු පිටපත් | අයදුම්පත්‍ර ගාස්තුව | 100 0 |
| 18. | තක්සේරු ලේඛනයට නම ඇතුළත් කිරීම | ලියාපදිංචි ගාස්තුව | 600 0 |
| 19. | තක්සේරු ලේඛනයේ පිටපතක් ලබා ගැනීම | පිටපතක් සඳහා ගාස්තුව | 100 0 |
| 20. | වරිපනම් උද්‍ධෘත ලබා ගැනීම | එක් වර්ෂයක් සඳහා ගාස්තුව | 50 0 |
| 21. | ප්‍රචාරක දැන්වීම් බැනර් ප්‍රදර්ශනය කිරීම | වර්ග අඩි 01ක් දින 14ක් ප්‍රදර්ශනය කිරීම | 50 0 |
| 22. | දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම - ස්ථිර | වර්ග අඩි 01 වර්ෂයක් සඳහා ප්‍රදර්ශනය කිරීම<br>වර්ග අඩි 01 ක් සභා දේපළ තුළ වර්ෂයක් ප්‍රදර්ශනය සඳහා බිම් කුලිය | 125 0<br>250 0 |
| 23. | අනවසර ප්‍රචාරක දැන්වීම් | කටවුට් වර්ග අඩි 01 ක් සඳහා<br>පෝස්ටර් වර්ග අඩි 01 ක් සඳහා<br>බැනර් වර්ග අඩි 01 ක් සඳහා | 200 0<br>100 0<br>200 0 |
| 24. | එල්. ඊ. ඩී. ප්‍රචාරක දැන්වීම් | වර්ග අඩි 01ක් මාසයක් ප්‍රදර්ශනය කිරීම සඳහා | 250 0 |
| 25. | පුස්තකාල සාමාජික ගාස්තු | • අයදුම්පත්‍ර ගාස්තුව<br>• නගර සීමාව ඇතුළත වැඩිහිටි අයෙක් සඳහා වසර 02ට සාමාජිකත්වය ලබා ගැනීම<br>• නගර සීමාව ඇතුළත ළමා වසර 02ට<br>• නගර සීමාව ඇතුළත සාමාජිකත්වය අළුත් කිරීම (වැඩිහිටි සහ ළමා දෙපිරිසටම)<br>• නගර සීමාවෙන් පිටත - වැඩිහිටි වසර 02<br>• නගර සීමාවෙන් පිටත - ළමා වසර 02<br>• නගර සීමාවෙන් පිටත සාමාජිකත්වය අලුත් කිරීම - වැඩිහිටි<br>• නගර සීමාවෙන් පිටත සාමාජිකත්වය අලුත් කිරීම - ළමා<br>• පාඨක සමාජයේ සාමාජිකත්වය ලියාපදිංචි කිරීම<br>• පාඨක සමාජයේ මාසික සාමාජික ගාස්තුව<br>• පොත් ප්‍රමාද ගාස්තුව එක් දිනකට<br>• නැතිවූ පොතක් සඳහා<br>• අමතර දඩය පොතෙහි වටිනාකමින්<br>• නැවත සකස් කරන ලද පොතකට | 10 0<br>200 0<br>100 0<br>50 0<br>300 0<br>100 0<br>100 0<br>100 0<br>5 0<br>5 0<br>2 0<br>පොතෙහි නියම වටිනාකම<br>25%<br>200 0 |
| 26. | පා පැදි බලපත්‍රය | • අයදුම්පත්‍ර ගාස්තුව<br>• බලපත්‍රය | 100 0<br>05 0 |
| 27. | අනුමත මිනින්දෝරු සැළැස්ම | සහතික පිටපතක් නිකුත් කිරීම<br>ලේඛන සෙවීමේ ගාස්තු නම පමණක් ලබා දී ඇති විට<br>ලේඛන සෙවීමේ ගාස්තු නම හා වර්ෂය ලබා දී ඇති විට<br>ලේඛන සෙවීමේ ගාස්තු නම හා අංකය ලබා දී ඇති විට | 250 0<br>500 0<br>300 0<br>200 0 |

| අනු. අංකය | සේවාව | කාරණය | 2019 වර්ෂයට ගාස්තුව රු. |
|---|---|---|---|
| 28. | අනුමත ගොඩනැගිලි සැළැස්ම | කාලය දීර්ඝ කර ගැනීම එක් වසරක් සඳහා<br>සහතික පිටපතක් නිකුත් කිරීම<br>ලේඛන සෙවීමේ ගාස්තු නම පමණක් ලබා දී ඇති විට<br>ලේඛන සෙවීමේ ගාස්තු නම හා වර්ෂය ලබා දී ඇති විට<br>ලේඛන සෙවීමේ ගාස්තු නම හා අංකය ලබා දී ඇති විට | 300 0<br>500 0<br>500 0<br>300 0<br>200 0 |
| 29. | පෙර පාසල | ළමුන් ඇතුළත් කිරීමේ ගාස්තුව (එක් වර්ෂයකට) | 1,500 0 |
| 30. | අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් | • එක් දිනක් සඳහා බිම් බද්ද<br>• වැඩිවන අමතර දිනයක් සඳහා | 3,000 0<br>1,000 0 |
| 31. | කාබනික පොහොර අලෙවිය | • කිලෝ 50 පොහොර උරයක්<br>• කිලෝ 25 පොහොර උරයක්<br>• කිලෝ 10 පොහොර උරයක් | 450 0<br>225 0<br>150 0 |
| 32. | මාර්ග පළුදු කිරීම | • කාපට් ඇතිරූ මාර්ග තලය පළුදු කිරීම<br>• තාර/කොන්ක්‍රීට්/අන්තර් සම්බන්ධිත ගල් අතුරන ලද මාර්ග තලය පළුදු කිරීම වර්ග අඩි 01ක් සඳහා<br>• පස් සහිත මාර්ග උරහිස සහ මාර්ග තලය පළුදු කිරීම වර්ග අඩි 01 සඳහා | අවසර නැත<br>රු. 520 0<br>155 0 |
| 33. | පොදු වැසිකිළි පිරිසිදු කිරීමේ ගාස්තු | වැසිකිළි/කැසිකිළි යාම සඳහා එක් වරකට | 10 0 |
| 34. | හිස් තාර බැරල් | එක තහඩුවක් සඳහා | 200 0 |

10-1238/8

---

## බලංගොඩ නගර සභාව

### මස් පිණිස සතුන් මැරීම හෝ මරන ලද සතුන්ගේ මස් ප්‍රදර්ශනය සම්පූර්ණයෙන්ම තහනම් දින නිවේදනය කිරීම - 2019 වර්ෂය

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත හෙවත් ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 272 අධිකාරයේ 03(අ) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 13 අ (1) වගන්තිය අනුව පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දිනයන්හි සහ බලංගොඩ නගර සභාව විසින් අවස්ථාවෝචිත පරිදි තීරණය කරනු ලබන දිනයන්හි බලංගොඩ නගර සීමාවේ 2019 වර්ෂයේ මස් පිණිස සතුන් මැරීම හෝ මරන ලද සතුන්ගේ මස් විකිණීම හෝ විකිණීම සඳහා මස් ප්‍රදර්ශනය කිරීම, විකිණීම සඳහා මස් ළඟ තබා ගැනීම 2018.09.13 වන දින බලංගොඩ නගර සභාවේ පැවති මහ සභා තීරණ අංක 04:02:11 යටතේ සම්පූර්ණයෙන් තහනම් කරනලද බවත්, මෙකී නිවේදනය 2019 වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වියයුතු බවටත් නිවේදනය කරමි.

චමික ජයමිණි විමලසේන,
සභාපති.
බලංගොඩ නගර සභාව.

2018 ඔක්තෝබර් මස 04 වැනි දින,
බලංගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| අනු. අංකය | වර්ෂය | මාසය | දිනය | කාරණය |
|---|---|---|---|---|
| 01. | 2019 | ජනවාරි | 15 - අඟහරුවාදා | දෙමළ තෛපොංගල් දිනය |
| 02. | 2019 | ජනවාරි | 20 - ඉරිදා | දුරුතු පුර පසළොස්වක පෝය දිනය |
| 03. | 2019 | පෙබරවාරි | 04 - සඳුදා | ජාතික නිදහස් දිනය |
| 04. | 2019 | පෙබරවාරි | 19 - අඟහරුවාදා | නවම් පුර පසළොස්වක දිනය |
| 05. | 2019 | මාර්තු | 04 - සඳුදා | මහ සිව රාත්‍රී දිනය |
| 06. | 2019 | මාර්තු | 20 - බදාදා | මැදින් පුර පසළොස්වක පෝය දිනය |
| 07. | 2019 | අප්‍රේල් | 13 - සෙනසුරාදා | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනට පෙර දිනය |
| 08. | 2019 | අප්‍රේල් | 14 - ඉරිදා | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනය |
| 09. | 2019 | අප්‍රේල් | 19 - සිකුරාදා | බක් පුර පසළොස්වක පෝය දිනය |
| 10. | 2019 | අප්‍රේල් | 19 - සිකුරාදා | මහ සිකුරාදා දිනය |
| 11. | 2019 | මැයි | 01 - බදාදා | ලෝක කම්කරු දිනය |
| 12. | 2019 | මැයි | 18 - සෙනසුරදා | වෙසක් පුර පසළොස්වක පෝය දිනය |
| 13. | 2019 | මැයි | 19 - ඉරිදා | වෙසක් පුර පසළොස්වක පෝය දිනට පසු දිනය |
| 14. | 2019 | ජූනි | 05 - බදාදා | ඊදුල් ෆීතර් (රාමසාන්) දිනය |
| 15. | 2019 | ජූනි | 16 - ඉරිදා | පොසොන් පුර පසළොස්වක පෝය දිනය |
| 16. | 2019 | ජූලි | 16 - අඟහරුවාදා | ඇසළ පුර පසළොස්වක පෝය දිනය |
| 17. | 2019 | අගෝස්තු | 12 - සඳුදා | ඊදුල් අල්හා (හජ්ජි උත්සව දිනය) |
| 18. | 2019 | අගෝස්තු | 14 - බදාදා | නිකිණි පුර පසළොස්වක පෝය දිනය |
| 19. | 2019 | සැප්තැම්බර් | 13 - සිකුරාදා | බිනර පුර පසළොස්වක පෝය දිනය |
| 20. | 2019 | ඔක්තෝබර් | 13 - ඉරිදා | වප් පුර පසළොස්වක පෝය දිනය |
| 21. | 2019 | ඔක්තෝබර් | 27 - ඉරිදා | දීපාවලී උත්සව දිනය |
| 22. | 2019 | නොවැම්බර් | 10 - ඉරිදා | (මීලාද්-උන්-නබි) දිනය නායකතුමාගේ උපන් දිනය |
| 23. | 2019 | නොවැම්බර් | 12 - අඟහරුවාදා | ඉල්පුර පසළොස්වක පෝය දිනය |
| 24. | 2019 | දෙසැම්බර් | 11 - බදාදා | උඳුවප් පුර පසළොස්වක පෝය දිනය |
| 25. | 2019 | දෙසැම්බර් | 25 - බදාදා | නත්තල් උත්සව දිනය |

10 - 1238/9

---

## බලංගොඩ නගර සභාව

### රථවාහන නැවතුම් සීමාව සහ රථ වාහන නැවතුම් ගාස්තු නිවේදනය කිරීම 2019 වර්ෂය

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරය හෙවත් 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 184 වන වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 94(1) වන වගන්තිය හා 157 (14) (අ) වගන්ති ප්‍රකාරවත් ඊට අදාළ අතුරු ව්‍යවස්ථාවන් යටතේත් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරවත් බලංගොඩ නගර සභා බල සීමාවේ රථ වාහන නතර කිරීමේ දී රථ වාහන නැවතුම් ගාස්තු අය කරනු ලබන සීමාව පහත 1 වන උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වන ලද ආකාරයටත්, එම සීමාව ඇතුළත නතර කරනු ලබන එක් එක් රථ වාහනයකින් එක් දිනයකට අයකළ හැකි උපරිම ගාස්තු මුදල පහත II වන උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වෙන ආකාරයට විය යුතු බවටත් 2018.09.13 වන දින බලංගොඩ නගර සභාවේ පැවති මහ සභා තීරණ අංක 04:02:11 යටතේ අනුමත කරන ලද බවට මෙයින් නිවේදනය කරමි.

චමික ජයමිණි විමලසේන,
සභාපති.
බලංගොඩ නගර සභාව.

2018 ඔක්තෝබර් මස 04 වැනි දින,
බලංගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

**ඉහත කී 1 වන උපලේඛනය**

බලංගොඩ නගර සභා බල සීමාවේ වෙළඳපොල සීමාව ලෙස නම්කර ඇති සීමාවේ කොටසක් වන බලංගොඩ බදුල්ල, මාර්ග යේ කිරිදිගල පල්ලිය (වැලිහරනාව හන්දිය) දක්වාද බලංගොඩ රාස්සගල පාරේ කොන්වන්ට් විදුහල දක්වාද, බලංගොඩ රත්නපුර මාර්ගයේ HLW ඉන්ධන පිරවුම්හල දක්වාද, බලංගොඩ කල්තොට පාරේ ධර්මරත්න බස්නායක මහතාගේ නිවස දක්වාද, දෙරවෙල නව අතුරු මාර්ගය (මොහාන් සාලිය එල්ලාවල මාවත) ද ඇතුළත් වන පරිදි බලංගොඩ නගරයේ කෙළින් වීදිය, තානායම් පිවිසුම් පාර, බාන්ස් රත්වත්ත මාවත, බස් නැවතුම්පල පාර, පල්ලිය පාර හා ඒ ඇතුළත ඇති සියලුම වීථීන් හා වීථීන් දෙපස ගොඩනැගිලි සීමාව ඇතුළත වන සීමාව වේ.

ඉහත කී II වන උපලේඛනය

| | | |
|---|---|---|
| ලොරියක්, බස්රථයක් හෝ වෙන යම් වාහනයකින් | - | රු. 50 0 |
